# ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය

## කෘෂිකර්ම අමාත්‍යාංශය

# දැන්වීමයි

## NFPB Agro Fresh Super අලෙවි පරිශ්‍රය සඳහා ව්‍යවසායකයකු තෝරා ගැනීම

ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයට අයත් දෙහිවල නො. 21, ගාලු පාර පිහිටි NFPB Agro Fresh Super අලෙවි පරිශ්‍රය තුල පහත ව්‍යවසායක අවස්ථාව සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

**එළවළු, පලතුරු හා අගය එකතු කළ ආහාර, කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමේ ව්‍යවසායක**

ඉහත ව්‍යවසායක අවස්ථාව සඳහා කැමැත්තක් හැකියාවක් ඇති පුද්ගලයින්, ගොවි සමිති, සංවිධාන, සමාගම් හා ආයතනවලට ස්ථානය පරීක්ෂා කර බලා මිල ගණන් ඉදිරිපත් කළ හැකි අතර, ඒ අතුරින් සුදුසුකම්ලත් එක් අයකු මණ්ඩලය මගින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් තෝරා ගනු ලැබේ.

**සපුරාලිය යුතු සුදුසුකම්**

- බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු හෝ බස්නාහිර පළාත තුළ ලියාපදිංචි ආයතනයක් හෝ සංවිධානයක් වීම. (ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් තිබිය යුතුය.)
- මූල්‍ය ආයෝජන හැකියාවක් තිබිය යුතුය. (බැංකු වාර්තා මගින් සනාථ කළ යුතුය.)
- අපරාධ හෝ සිවිල් නීතිරීති පදනම්ව උසාවියකින් වරදකරුවකු බවට පත් නොවූ බවට ලිඛිත තහවුරුවක් තිබීම. (ග්‍රාම නිලධාරී සහතිකයක් මගින් හෝ පොලිස් වාර්තාවක් මගින් සම්මුඛ පරීක්ෂණයේදී සනාථ කළ යුතුය.)
- ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ සේවය කරනු ලබන තැනැත්තෙකු හෝ එම තැනැත්තාගේ ලඟම ඥාතියෙකු (මව, පියා, සහෝදරයින්, සහෝදරියන්, භාර්යාව, ස්වාමි පුරුෂයා හෝ දරුවන්) නොවිය යුතුය.
- අදාළ ක්ෂේත්‍රයේ අත්දැකීමක් සහිත අයෙකු/ආයතනයක්/සංවිධානයක් වීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

මේ සඳහා වන අයදුම්පත්‍රය, අධ්‍යක්ෂ, ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය, නො. 45, කිරිමණ්ඩල මාවත, නාරාහේන්පිට යන ලිපිනයෙන් හෝ www.nfpb.lk යන වෙබ් අඩවියෙන් **2020.12.15** වන දින සිට ලබාගැනීමේ හැකියාව ඇත.

අයදුම්පත්‍ර ගාස්තුව **රු. 500.00** ක් වන අතර එම මුදල බොරැල්ල ලංකා බැංකු ගිණුම් අංක 194125 ට **"ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය"** නමින් බැරකර ලබාගත් රිසිට්පත හා අයදුම් පත්‍රය **2020.12.31** දින හෝ ඊට ප්‍රථම, අධ්‍යක්ෂ, ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය, නො. 45, කිරිමණ්ඩල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැක.

තවද, අයදුම් පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"GAP නිෂ්පාදන අලෙවි කිරීමේ ව්‍යවසායක අයදුම් පත්‍රය"** යන්න සඳහන් කළ යුතුය.

සභාපති,

**ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය**

**නො. 45, කිරිමණ්ඩල මාවත,**